පුරවැසියකුගේ සටහන්

සුනන්ද දේශප්‍රිය

2007.07.22

ඩලස් ඔබට ඇහෙනවාද ? (2)

මහියංගනයේ පොලිස් කොමිටි රැස්වීම සාමාන්‍යයෙන් තිබුනේ මාසයේ අන්තිමට ය. ගෙදර ගොස් ඒමට මා යොදා ගත්තේ ද ඒ දවස ය. රැස්වීම අවසන් කොට අන්තිම බසයේ නුවරට ද එතැනින් කොළඹට ද එතැනින් අම්බලන්ගොඩට ද යාම මගේ පුරුද්ද විය. මේ වසර 36කට පෙර ය. ලංගමය තිබූ කාලයේ ය.

රට එදාට වඩා අද කොච්චර දියුණු ද?

ගාලු පෝලිමේ මෙවැනි දැන්වීමක් තිබුණි. "රාත්‍රී 10.00න් පසු පිටත්වන සෑම බසයක් ම පානදුරයේ සිට සෑම බස් නැවතුමක ම නතර කළ යුතු ය." දිවා කාලය පුරා සෑම විනාඩි තුනකට ම නුවරට ද සෑම විනාඩි දෙකකට ම ගාල්ලට ද බස් රථයක් කොළඹ සිට පිටත් වුනි. රාත්‍රී බස් ගමනා ගමනයේ කාලසටහන පැහැදිලිව සටහන් කර තිබුණි. ඒ එදා ය.

මෙදා, සෙනසුරාදා රෑ ගුණසිංහපුර පුද්ගලික බස් නැවතුමට ය. මා ගියේ 9.30ට ය. කුරුණෑගල යන බස් නැත. දුර ගමන් බස් රථ ළඟට ගන්නේ ද නැත. තිබුනේ වව්නියාවට යන බස් දෙකක් පමනි. එම බස් රථ දෙකට සෙනග නැංවීමට කලු කමීසකාර රනර්ලා තිදෙනෙකු ම සිටියෝ ය. රෑ දහයට පිටත් වූ එම බසයේ යෑමට මට රුපියල් 180 අවසර පතක් ගැනීමට සිදු විය. එසේ නැත්නම් බස් රථයට ද පාඩු ය.

ගුණසිංහ පුර බස් නැවතුම වටා ම වාගේ සෙනග පොදිකමින් සිටියේ කඩවත සිට නිට්ටඹුව දක්වා යන බස් රථ අල්ලා ගැනීමට ය. බස් නැත.

පුද්ගලික බස් සේවාව සඳහා කාල සටහන් නැති වීමත් රාත්‍රී බස් රථ නැති වීමත් මහජනයා පෙළෙන ප්‍රධාන කරුනු දෙකකි. දිනකට මිලියන ගණනාවක් වන කප්පම් ජාවාරමක් විසින් පුද්ගලික බස් සේවය වක්‍රව පාලනය කරයි. මේ මැර ජාවාරම පිටුපස දේශපාලන ජාවාරම්කරුවන් නැත්නම් එය මෙතරම් කල් රදා සිටින්නේ නැත.

පුද්ගලික බස් සේවාව ක්‍රමවත් කිරීමට බැරි ප්‍රධානතම සාධකය තනි තනි බස් හිමිකම යි. ඊට පිලියමක් වශයෙන් මගේ මතකයේ හැටියට 2004 අවසානය වන විට අවම වශයෙන් බස් 50ක සමාගමක් වශයෙන් පුද්ගලික බස් සංවිධානය විය යුතු ය යනුවෙන් නියෝගයක් ආණ්ඩුව විසින් නිකුත් කරන ලද්දේ ඒ නිසා ය. නමුත් බස් සමාගම් හැදුනේ නැත. නීතිය බල්ලාට ගියේ ය.

එපරිද්දෙන්ම පුද්ගලික බස් සේවයෙහි ගමන් අවසර පත් අනිවාර්‍ය කිරීමට ගිය හැම ඇමැතියකුම පස්ස බිම ඇන ගත්තා ය. කොන්දොස්තරවරුන් පුහුණුකර හැඳුනුම්පත් ලබා දෙන බවට දුන් පොරොන්දු වාෂ්ප වූයේ පොරොන්දු අමතක වන්නටත් පෙර ය. දැන් අද ඉද හිට ලැබෙන ටිකට් පතෙහි වුව කිසිදු ක්‍රමයක් නැත.

එකළ මගේ මස්සිනා කෙනෙකු බලපිටිය ගුරු විදුහලට නොතේරුනේ ලකුණු දෙක තුනකිනි. පසුව ඔහු විභාගයකින් සමත්ව බස් කොන්දොස්තරවරයකු බවට පත් විය. ප්‍රථමයෙන් ලඟ දුර බස් රථ සේවයට ඔහු යෙදවුනේ දෙසතියක පුහුණුවකින් පසු ය. කඩ ඉමෙන් කඩ ඉමට සටහන් දමා ගනිමින් බස් රථයේ අවසර පත් දීම කලාවකි. ඒ සඳහා අධ්‍යාපනයක්ද

ඉගෙනීමක් ද අවශ්‍ය ය. අද සිටින පුද්ගලික බස් සහායකයින්ගෙන් ඒ හැකියාව ඇත්තේ කීයෙන් කී දෙනෙකුට ද?

අද ප්‍රවාහනය සේවයක් නොව ජාවාරමකි. යහපත් ලෙස සිය සේවාව කරගෙන යන අතලොස්සක් ද සිටිති. නමුත් හොරකම, මැරකම, අමිනිස්කම අද එහි පොදු ලක්ෂණ ය වී තිබේ. විශේෂයෙන් සාමාන්‍ය ශාස්ත්‍ර කාණ්ඩය යටතේ ලග දුවන බස් රථ එකම පරමාර්ථය කර ගන්නේ කෙසේ හෝ ආදායම වැඩිකර ගැනීමට ය.

අපේ දේශපාලන පෙකෙනි වැළ කැපුණු කොමියුනිස්ට් පක්ෂයේ චීන පිලට සම්බන්ධ ශක්තිමත් ප්‍රවාහණ සේවා සමිතියක් විය. මහ වැඩ වර්ජනයක් අවස්ථාවේ (1965 විය යුතු ය) වැඩ වරාසිටි ලංගම සේවකයින්ට ඉදිආප්ප ශ්‍රමදානය තිබුනේ අපේ ගෙදර ය. එම සමිතියේ ප්‍රධානීන් සමහරකු අපේ පවුලේ හිතවතුන් වැනි විය. නමුත් සීනුව නාද කළ පසු ලංගම බස් රථයක් නියමිත නැවතුම පසුකර ගියේ යැයි තාත්තා පැමිණිල්ලක් දැමූ බවත් එයට විහාගයක් තිබූ බවත් මට මතක ය.

අද මහජනයාට පුද්ගලික බස් සේවය ගැන නිසි පැමිණිල්ලක් කර යහතින් ඉන්නට පුළුවන් වෙයි ද? මා මේ සටහන ලියන්නේත් ඊළග දවසේ බස් පොළට යන්නේ කෙසේ දැයි දෙකට දෙවාරමට ය. මහජන පැමිණිළි යාණ්ත්‍රනයක් පැවැතීම ඕනෑම ආයතනයක යහ පාලනයට අවශ්‍ය ය. ප්‍රයෝජනවත් ය. නමුත් අද බස් රථයක දී කවර හෝ විරුද්ධ අදහසක් කීම ආපසු බැනුම් ඇසීමට නිමිත්තකි. දෙකට නැවී පස්සෙන් පස්සට යන විධායක නිලධාරීන් බස් රථවලදී දැක ගැනීම විරළ දෙයක් නොවන්නේ ඒ නිසා ය.

අපේ දරුවන් පාසැල ඇරී ගෙදර එන්නේ මැල්සිරපුර බස් රථ වල ය. අප ඉන්නේ ඉබ්බාගමුවටත් මෙහා යකල්ලේ ය. ඉබ්බාගමුවට බස් නැත. මැල්සිරිපුර බස් රථවල ඉබ්බාගමුවෙන් මෙහා වාඩිවී යන්නට ඉඩ දෙන්නේ නැත. වෙහෙස වී ගෙදර එන අපේ දරුදැරියන් යා යුත්තේ හිර වි හිටගෙන ය. මේ නීති හැදුවේ කව්ද? මෙතෙක් ආ කිසිදු ඇමැතිවරයකුට මේ අවනඩුව ඇසුනේ වත් නැත. රට පුරාම පාසැල් ඇරී යන දස දහස් ගණන් දරුවන් මේ බස්රථ වල ගෙන යන්නේ හිටගෙන පොල් මෙන් පටවා ගෙන ය. දුර ගමන් බස් රථවල පොඩි දරුවන්ට බාග අවසර පත්‍ර නැත. යා යුත්තේ මව් උකුලේ ය.

මේ කතාවේ අනෙක් ඛේදවාචකය නම් පුද්ගලික බස් සේවයේ රැකියා කරන දසදහස් ගණනකට කිසිදු වෘත්තීය අයිතියක් හෝ රැකියා සුරක්ෂිත බවක් නැති බව යි. ඒ බොහෝ සෙනෙක් ජාවාරම්කරුවන් විසින් යුෂ උරා බී ඉවතට විසිකර දමනු ඇත්තේ හප ලෙස ය.

මේ ප්‍රශ්න ගැන කතා කරන දේශපාලනඥයින් සිටින්නේ කොහි ද? එක තැනකින්වත් පටන් ගන්න බැරිද? එක පළාතකින් වත්? එක මාර්ගයකින්වත්?

ඩලස්, ඔබ පිරිසක් 1990 ගණන්හි හිරු පුවත්පත දෙවනවරට දියත් කළ අවස්ථාවේ මා කීදේ මතක ද? එවැනි පුවත්පතක් ගෙන යාමට නම් අධිරාජයා අසු පිටින් බිමට ඇද දමන තරමේ අධිශ්ඨානයක් අවශ්‍ය බව ය.

මේ අභියෝගය ඊට වෙනස් නැත. අසු විසින් ඔබ පාගා නොදමනු ඇතැයි ද එසේත් නැත්නම් අසු පිටට ම නංවා නොගනු ඇතැයි ද පතමි.